

පූජ්‍ය කුඩාවැල්ලේ වංගීස හිමි



පූජ්‍ය දොඩම්පහල චනද්‍රසිරි හිමි



පූජ්‍ය තපෝවනයේ නිවාත හිමි

# අභයභූමි තපෝවනයේ ඉතිහාසය

කෑගල්ල පිටිහුම බණ්ඩාරනායක මාවතේ පිහිටි ස්වාභාවික වනාන්තරයක් වූ කුරුළුකැළය රක්ෂිතයේ සිවුරු රෙදි ආවරණය කරගත් කුඩා කුටියක භාවනා යෝගීව ස්වාමින් වහන්සේ නමක් වැඩ විසූහ. කෑගල්ල නගරාසන්නයේ පිහිටි පිටිහුම සහ රද්දල ගම්පියසට පිණ්ඩපාතයේ වැඩම වූ ස්වාමින් වහන්සේට ගම්වැසියෝ දනය පිරිනැමූ අතර වුන්වහන්සේ කෙරෙහි පැහැදී අවට සුද්ධ පවිත්‍රකර අතු සෙවිලි කොට පුංචි කුටියක් තනා දුන්හ. මෙම අවධියේ ලංකාවේ විවිධ ප්‍රදේශවල තපෝවන භාවනා ශාඛා මධ්‍යස්ථාන පිහිට වූ තම ගුරුදේව නාහිමිපණන් වහන්සේ වන අතිපූජ්‍ය කුඩාවැල්ලේ වංගීස ස්වාමින් වහන්සේ විසින් රජයෙන් කරන ලද ඉල්ලීමට අනුව 1969 වසරේ භාවනා මධ්‍යස්ථානයක් ඉදිකර ගැනීම පිණිස අක්කර දෙකක භූමි භාගයක් කුරුළු කැළයෙන් වෙන්කර දෙන ලදී. නාහිමිපාණන් වහන්සේ පිහිට වූ මාතික මාතා ශාඛා සමිතියේ ගොඩනැගිලි ඉදිකර ගැනීම පිණිස 1971 වසරේ නැවත අක්කරක බිම් කොටසක් වෙන්කර ගැනීමට සමත්විය. කුරුළු කැළයෙන් අක්කර තුනක් ලබා ගැනීමට හැකිවීම නායක ස්වාමින් වහන්සේගේ භාග්‍යකි.

විෂකුරු සතුන්, කටු කෙහෙළින්, කෑඩල්ලන්ගෙන් පිරුණ වනපියසේ ඉතා දුස්කර පරිසරයක වැඩ විසූ උන්වහන්සේ මාස කීපයකින් එම ස්ථානය හැරගියහ. මෙසේ විටින්විට ස්වාමින් වහන්සේලා පස් නමක් පමණ වැඩ විසූ අතර එම ස්වාමින් වහන්සේලාද ස්ථානය හැරගියහ. 1970 වර්ෂයේ සිට 1976 දක්වා පූජ්‍ය තපෝවනයේ ධම්මින්ද ස්වාමින් වහන්සේ වැඩ වෙසෙමින් තපෝවන භාවනා මධ්‍යස්ථානයට අවශ්‍ය මූලික ගොඩනැගිලි ඉදිකර ගැනීම පිණිස බලවත් උසත්සාහයක යෙදුන නමුත් උත්සාහයේ තරමට ප්‍රතිඵල ලබා ගැනීමට උන්වහන්සේට නොහැකිවිය. 1971 කැරැල්ල පැවති අවස්ථාවේ ගුවනින් බෝම්බ දැමීම නිසා තාවකාලික ඉදිකිරීම් පවා විනාශවිය.

කෑගල්ල ප්‍රදේශයේ පිහිට වූ මෙම තපෝවනය දිනෙන් දින පිරිහීම නිසා දයක පිරිස ශ්‍රී කල්‍යානිවංශ නිකායේ අධිකරණ සංඝනායක අතිපූජ්‍ය කුඩාවැල්ලේ වංගීස නායක ස්වාමින් වහන්සේ වෙත නිතරම සුදුසු ස්වාමින් වහන්සේ නමක් ඉල්ලා කරදර කලහ. මෙම ප්‍රශ්නය විසඳීම පිණිස නාහිමිපාණන් වහන්සේගේ ආරාධනයෙන් 1976 වසරේ ජනවාරි මස දෙවෙනි දින පූජ්‍ය තපෝවනයේ නිවාත ස්වාමින් වහන්සේ කෑගල්ල අභයභූමි තපෝවනයට වැඩම කලහ. මෙහි ස්වර්ණමය යුගයේ ආරම්භය එදිනය. එම වසරේ දුරුතු පුර පසළොස්වක පෝය දින සිල් සමාදන්වීමට හය දෙනෙක් පැමිණ සිටියහ. කුඩා පොල් අතු මඩුවක එම හය දෙනාට දහම් දේශනා කළ වුන්වහන්සේ එම වසරේම ධර්මශාලාවක් ඉදිකිරීමට මුලගල් තබන ලදී. ධර්ම දේශනා කිරීමට අවශ්‍ය පොත්-පත් කිසිවක් නොතිබුන බැවින් ඒවා සොයාගැනීමට සිදුවිය. පරිභෝගයට අවශ්‍ය ජලය කැලය කෙලවර පිහිටි නාන ලිඳකින් දුස්කරව ගෙනවිත් රැස්කර තබාගත් නිසා 1978 වසරේ නගරසභා නළ ජලය ලබා ගැනීමත්, විහාර මන්දිරයක් ඉදිකිරීම පිණිස මුල්ගල් තැබීමත්, මෙතෙක් කල් වන්දනා කිරීමට බුද්ධපූජා පැවැත්වීමට පවා තිබුනේ කුඩා බුද්ධ රූපයකි. එමනිසා අඩි තුණක් පමණ උස ප්‍රතිමා වහන්සේ නමක් මහනුවර ශ්‍රී දළඳ තපෝවනයෙන් ගෙන්නා ගැනීමත් සිදුකළේ මෙම වර්ෂයේය.

1979 වසර තපෝවන ඉතිහාසයේ තවත් ඉතාම වැදගත් වසරකි. ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ඵල බෝධීන් වහන්සේනමක් රෝපණය කිරීම, ඉදිවෙමින් පැවති අභිනව විහාර මන්දිරයේ සමාධි බුද්ධ ප්‍රතිමා වහන්සේ නෙළීම පිණිස මුල්ගල් තැබීම, විදුලි ආලෝකය ලබාගැනීම සහ අඩි 1300 පමණ වන තපෝවනයට පිවිසුම් මාර්ගයේ කොටසක් තාර දැමීම ඇතුළු ප්‍රධාන වැඩ කොටසක් නිම කිරීමට එම වසරේ හැකිවිය. 1980 වසරේ ධර්මශාලාව විවෘත කරන ලද අතර 81 වසරේ අභිනව බුදුමැදුරේ නෙළන ලද ඉතාම දර්ශනීය සමාධි ප්‍රතිමා වහන්සේ සායම් ආලේප කොට නේත්‍රා පිහිටුවා විහාර මන්දිරය විවෘත කරන ලදී. පොල් අතු මඩුවේ බුදුබණ ඇසූ පිංවතුන්ට, අතු සෙවිලි කළ විහාරයේ වන්දනා කළ පිංවතුන්ට මෙය ඉමහත් සැනසිල්ලක් වූහ.

කටුමැටි ගසා අතු සෙවිලි කොට ගොම මැටි ගාන ලද පුංචි දනශාලාව වෙනුවට ස්ථිර දනශාලාවක් ඉදිකිරීම පිණිස මුල්ගල් තැබීම සහ කුටි, වතුර ටැංකි, සක්මන් මළු ආදිය ඉදිකිරීම 1982 වසරේ සිදු කෙරින. දිනෙන් දින එක්රැස්වන සිල් පිරිසට ධර්මශාලාව ප්‍රමාණවත් නොවීම නිසා නැවත ශාලව විශාල කිරීමට පියවර ගැනින. 1984 වසරේ දනශාලාව ඉදිකිරීම් නිමා කොට විවෘත කරන ලදී. මහා සංඝරත්නයට විනයකර්ම සඳහා සීමා සම්මත විනයකර්මයක් සිදුකිරීමත්, දුරකථන පහසුකම් ලබා ගනීමත්, විදුලි සැපයුම වූ පේස් දක්වා වර්ධනය කිරීමත්, මෙම වර්ෂයේ සිදුකළ පිංකම් අතර ප්‍රධානය. 1989 වර්ෂයේ සීමා මාලකය, ධාතුමන්දිරය ඉදිකිරීම පිණිස මුල්ගල් තැබූ අතර, 1991 වසරේ සීමාමාලකය විවෘත කොට, ගෙවී ගිය කාළය ඇතුලත තුන් වතාවක් විශාල කරන්නට සිදුවූ ධර්මශාලාව ප්‍රමාණවත් නොවීම නිසා අළුතින් විශාල පධාන්ඝර ශාලාවක් ඉදිකිරීම පිණිස මුල්ගල් තබන ලදී.

1993 වර්ෂයේ නේවාසික භාවනා පංති ආරම්භ කිරීම සහ තපෝවනයට පිවිසෙන මාර්ගය සම්පූර්ණයෙන් තාරදැමීම. 1994 වසරේ අභිනවයෙන් ඉදිකළ පධාන්ඝර ශාලාව විවෘත කිරීම. 1996 වර්ෂයේ සියක්නමකට අධික මහා සංඝරත්නය උදෙසා මහා සාංඝික දනයක් පිරිනමා ධාතුමන්දිරය විවෘත කරන ලදී. 1997 වර්ෂයේ මහා පධාන්ඝර ශාලාවද නැවත විශාල කිරීමට සිදුවිය. 1999 වසරේ නේවාසික ස්වාමින් වහන්සේලා උදෙසා සියලු පහසුකම් සහිත කුටි පහකින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකරන ලදී. 2000 සිට 2004 අතරතුර බෝධීන් වහන්සේ වටා රංවැට ඉදිකිරීම, දහම්පහන පොත් මුද්‍රණය කොට බෙදදීම, ස්වාමින් වහන්සේලාට භාවනා කුටි හයක් ඉදිකිරීම, ගිහි පිංවතුන්ට භාවනා කුටි හයක් ඉදිකිරීම සහ තෝරාගත් සාමණේර භික්ෂූන් වහන්සේලාට ශික්ෂත්ව ප්‍රධානය වැනි ලෝක ශාසනික සේවා සිද්ධ කෙරින.

2005 වර්ෂ මුළුමහත් බෞද්ධ ජනතාවටම ආශිර්වාද කරමින් අසිරිමත් අසූහාරදහසේ මහා කොඩි පූජාවක් සිදුකරන ලදී. එම පිංකමේ ආශිර්වාදයක් ලෙස චෛත්‍යක් ඉදිකරීමට රජයෙන් බිම් කොටසක් ලබා ගැනීමට හැකිවිය. චෛත්‍යක් ඉදිකිරීම පිණිස සුදුසු බිම් කොටසක් ලබා ගැනීම පිණිස වසර හයක් මුලුලලේ බොහෝ උත්සාහ ගත්තද සාර්ථක නොවීය. මහා කොඩි පූජාවෙන් ලත් ආශිර්වාදයෙන් එම බිම් කොටස වෙන්කර ගෙන 2006 වසරේ වෙහෙර වහන්සේ ඉදිකිරීම පිණිස මුල්ගල් තැබීමට හැකිවිය. ත්‍රිපිටකය තඹ පත්‍රයේ මුද්‍රණය කිරීමද එම වර්ෂයේ කළ අගනා පිංකමකි. 2007 වර්ෂයේ අති විශාල මහජනතාවක් සහභාගිවී චෛත්‍යයේ හතරැස් කොටුවේ ත්‍රිපිටකය ඇතුලු පූජාවස්තු නිධාන් කරන ලදී.

2009 වසර තපෝවන ඉතිහාසයේ තවත් වැදගත් සන්ධිස්ථානයකි. ශෛලමය සමාධි බුද්ධප්‍රතිමා වහන්සේලා වැඩම කිරීම, චෛත්‍ය රාජයාණන් වහන්සේගේ ධාතු නිධානය, කොත් වහන්සේ පැළඳවීම, විවෘත කිරීම, චෛත්‍ය ඇතුළේ ත්‍රිපිටකය සම්පූර්ණයෙන් දේශනා කිරීම, ඇතුලු පිංකම් රැසක් සිදුකරන ලදී.

1976 සිට 2010 දක්වා කාලය තුළ ඉහත සඳහන් අත්‍යවශ්‍ය ඉදිකිරීම් නිම කිරීම, වසරින් වසර කුල දරුවන් පැවිදි කිරීමත්, සුදුසු සාමණේර භික්ෂූන් උපසම්පදා කිරීම, නේවාසික ස්වාමීන් වහන්සේ විසි නමකට පමණ වැඩ සිටීමට අවශ්‍ය කුටි පහසුකම්, ජලය ලීටර් 40000 ක් රැස්කර ගැනීමට අවශ්‍ය ජල ටැංකි, ජලය සපයන ප්‍රධාන ළිං දෙකක්, පෝය දින සහ පිංකම් දින සහභාගිවන මහජනයා වෙනුවෙන් වැසිකිළි කාමර දහයක් සහ විශ්‍රාම ශාලාවක්ද, ඉදි කොට ඇත. මෙම කාල පරාශය තුළ සිද්ධ කරන්නට යෙදුන මහා පිංකම් ඓතිහාසික අසූහාර දහසේ කොඩි පූජාව, කෑගල්ල තපෝවනයේ සිට මහනුවර දළදා මැදුර දක්වා පෙරහැර සමයේ කොඩි වලින් සැරසීමේ පිංකම, නල්ලතන්නියේ සිට ශ්‍රී පාද පත්මය දක්වා කොඩි වලින් සැරසීමේ මහා කොඩි පූජාව, තිස්සමහාරාමයේ සිට කතරගම කිරිවෙහෙර දක්වා කොඩි වලින් සැරසීමේ මහා කොඩි පූජාව, සහ මහා ත්‍රිපිටක සජ්ඣායනාව මේවා තපෝවන ඉතිහාසයට එක්වන අසිරිමත් පිංකම්ය.